**ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනය**

# පරීක්ෂක වාර්තාව

AA2 විභාගය - ජූලි 2019

## (AA25) ව්‍යාපාර නීතිය හා ආචාර ධර්ම

(Business Law and Ethics)

## A - කොටස

### ප්‍රශ්න අංක 01

මෙම ප්‍රශ්නය ලකුණු 20 ක් සඳහා වූ වාස්තවික ප්‍රශ්න 10 කින් සමන්විත විය.

අයදුම්කරුවන්ගෙන් බහුතරය මෙම ප්‍රශ්නයට උත්තර ලියා තිබුණේය. බොහොමයක් අයදුම්කරුවන් ප්‍රශ්නයට වෙන්කළ මුළු ලකුණුවලින් අඩකට වඩා ලබාගෙන තිබුණි.

අයදුම්කරුවන්ගෙන් සැහෙන ප්‍රමාණයක් ප්‍රශ්න අංක 1.2 සහ 1.10 සඳහා නිවැරදිව උත්තර ලිවීමට අපොහොසත් වූ බව පෙනී ගියේය.

ප්‍රශ්න අංක 1.2 න් 1978 ශ්‍රී ලංකා ව්‍යවස්ථාව පිළිබඳ දැනුම පරීක්ෂා කරන ලදී. අයදුම්කරුවන්ගෙන් බහුතරය නිවැරදි උත්තර ලියා තිබුණේ නැත. ප්‍රශ්න අංක 1.10 න් වෘත්තීය ආචාරධර්මවල මූලික මූලධර්ම පිළිබඳ දැනුම පරීක්ෂාවට ලක්කර තිබේ. කෙසේවෙතත්, අයදුම්කරුවන්ගෙන් බහුතරය වෘත්තීය ආචාරධර්මවලට අදාල අරමුණුගතවීමේ සංකල්පය අවබෝධ කරගෙන තිබුණේ නැත. සමත්වීමේ ලකුණු කඩඉමට එළඹීම කෙරෙහි දායකත්වය **A කොටසින්** ලැබෙන නිසා, ඒ සඳහා ඉහළ ලකුණු ලබාගැනීම පිණිස අයදුම්කරුවන් ශ්‍රීලංකාවේ නීති හා නියාමන රාමුව, ජාත්‍යන්තර වෙළඳාම, ගිවිසුම් නීතිය සහ භාණ්ඩ විකිණීම පිළිබඳ ආඥා පනත යන මේවා පිළිබඳ හොඳ අවබෝධයක් ලබාගත යුතුය.

**සමස්තයක් වශයෙන් මෙම ප්‍රශ්නය සඳහා උත්තර ලිවීමේ කාර්යසාධනය සතුටුදායක විය.**

## B කොටස

### ප්‍රශ්න අංක 02

මෙම ප්‍රශ්නය බුද්ධිමය දේපළ පනත මත පදනම් වී ඇත. අයදුම්කරුවන් බොහොමයක් මෙම ප්‍රශ්නය තේරුම් ගැනීමට අපොහොසත් වී ඇත. අයදුම්කරුවන් කීපදෙනෙකු පමණක් නිවැරදි උත්තර ලියා තිබුණේය. බොහොමයක් අයදුම්කරුවන් පනතේ අදාල වගන්ති (9 සහ 10) හඳුනාගෙන නැත. එමනිසා, අදාල වගන්ති ඔවුන්ට දී තිබූ සිද්ධිදාමයට සම්බන්ධ කර උත්තර සපයා තිබුණේ නැත.

**සමස්තයක් වශයෙන් මෙම ප්‍රශ්නය සඳහා උත්තර ලිවීමේ කාර්යසාධනය සතුටුදායක නොවීය.**

### ප්‍රශ්න අංක 03

සරල මෙන්ම ඍජු ප්‍රශ්නයක් වූ මෙම ප්‍රශ්නයෙන් රක්ෂණ නීතිය පිළිබඳ දැනුම පරීක්ෂා කරන ලදී. අයදුම්කරුවන්ගෙන් බොහෝ දෙනෙකු මෙම ප්‍රශ්නයට උත්තර ලියමින් අමරට වන්දි සඳහා හිමිකම් පා, වන්දි ලබාගත නොහැක්කේ මන්දැයි පැහැදිලි කොට සම්පූර්ණ ලකුණු ලබාගෙන තිබුණේය.

**සමස්තයක් වශයෙන් මෙම ප්‍රශ්නය සඳහා උත්තර ලිවීමේ කාර්යසාධනය සතුටුදායක විය.**

## ප්‍රශ්න අංක 04

මෙය ජාත්‍යන්තර වෙළඳාමට සම්බන්ධ ප්‍රශ්නයක් විය. පිරිවැය, රක්ෂණ සහ නැව් ගාස්තු සම්බන්ධිත විකුණුම්කරුවෙකු වශයෙන් පැවරෙන වගකීම් / කාර්යභාර ආදිය එමගින් පරීක්ෂා කර ඇත. සමහර අයදුම්කරුවන් නිවැරදි උත්තර සපයා තිබුණේය. තවත් සමහර අයදුම්කරුවන්ට ප්‍රශ්නය හරිහැටි අවබෝධ කරගැනීමට හැකිවී නැත.

**සමස්තයක් වශයෙන් මෙම ප්‍රශ්නය සඳහා උත්තර ලිවීමේ කාර්යසාධනය සාමාන්‍ය මට්ටමක විය.**

## ප්‍රශ්න අංක 05

හවුල් ව්‍යාපාර පිළිබඳ නීතිය මෙම ප්‍රශ්නයෙන් පරීක්ෂා කර ඇත. දෙනු ලබන සිද්ධිදාමයකට න්‍යායාත්මක දැනුම යොදනු ලබන්නේ කෙසේදැයි එයින් පරීක්ෂා කර ඇත. අයදුම්කරුවන් බොහොමයක් මෙම ප්‍රශ්නයට උත්තර ලියා තිබූ අතර, **කමනීගේ** නෛතික අයිතිවාසිකම් සහ **රාජාගේ** යුතුකම් නිවැරදිව පැහැදිලි කර තිබුණි.

**සමස්තයක් වශයෙන් මෙම ප්‍රශ්නය සඳහා උත්තර ලිවීමේ කාර්යසාධනය සතුටුදායක විය.**

## ප්‍රශ්න අංක 06

මෙම ප්‍රශ්නයෙන් සමාගම්වලට අදාල සංස්ථාමය නීතිය පිළිබඳ දැනුම පරීක්ෂා කර ඇත. අයදුම්කරුවන් බොහොමයක් සමාගම් අධ්‍යක්ෂකවරුන් වශයෙන් පත්කරනු ලැබීමට අදාල සුදුසුකම් ගැන සඳහන් කොට පියුමි හා ශ්‍රී ලාල් අධ්‍යක්ෂකවරුන් ලෙස පත්කිරීම පිළිබඳ තත්ත්වය නිවැරදිව පැහැදිලි කර තිබුණි.

**සමස්තයක් වශයෙන් මෙම ප්‍රශ්නය සඳහා උත්තර ලිවීමේ කාර්යසාධනය සතුටුදායක විය.**

<u>C කොටස</u>

## ප්‍රශ්න අංක 07

ව්‍යංගයෙන් නියෝජ්‍යත්වය බිහිකිරීම මත පදනම්ව මෙම ප්‍රශ්නය ඉදිරිපත් කර ඇත. අයදුම්කරුවන් බොහොමයක් මෙම ප්‍රශ්නය නියෝජ්‍යත්ව නීතියට අදාල එකක් බව හඳුනාගෙන නැත. එමනිසා, ඇතැම් අයදුම්කරුවන් මෙය සමාගම් නීතියට සම්බන්ධ ලෙස උපකල්පනය කර උත්තර ලියා තිබුණි.

ඇතැම් අයදුම්කරුවන් නීතිමය තාර්කිකභාවය සඳහන් නොකොට, **සීමාසහිත ලයන් සමාගම** වෙත ගෙවීමට **සීමාසහිත ඇලීනා සමාගමට** ප්‍රතික්ෂේප කළ නොහැකි බව සඳහන් කර තිබුණේය.

**සමස්තයක් වශයෙන් මෙම ප්‍රශ්නය සඳහා උත්තර ලිවීමේ කාර්යසාධනය සතුටුදායක නොවීය.**

## ප්‍රශ්න අංක 08

මෙය කම්කරු නීතියට සම්බන්ධ කොටස් දෙකකින් යුක්ත සරල ප්‍රශ්නයකි.

**(a) කොටස** සේවක භාර අරමුදලට සම්බන්ධ එකකි. එහෙත්, අයදුම්කරුවන් බොහොමයක් එය සේවක භාර අරමුදලට සම්බන්ධයැයි පැහැදිලිව හඳුනාගෙන නොතිබුණි. ඔවුන් උත්තර ලියා තිබුණේ මෙම ප්‍රශ්නය සේවක අර්ථසාධක අරමුදලට අදාල සේ උපකල්පනය කරමිනි. සමහර අයදුම්කරුවන් සටහන් කර තිබුණේ **තාරා** රටහැර යන නිසා ඇයට සේවක භාර අරමුදලේ මුදල් ලබාගත හැකි බවය.

**(b) කොටස** පාරිතෝෂිකය ගණනය කිරීම පිළිබඳවය. අයදුම්කරුවන් බොහොමයක් නිවැරදි ලෙස උත්තර ලියා තිබුණි.

**සමස්තයක් වශයෙන් මෙම ප්‍රශ්නය සඳහා උත්තර ලිවීමේ කාර්යසාධනය සාමාන්‍ය මට්ටමක විය.**

## ප්‍රශ්න අංක **09**

ගනුදෙනු කළ හැකි ලියවිලි පිළිබඳ දැනුම මෙම ප්‍රශ්නයෙන් පරීක්ෂා කර ඇත. අයකැමිගේ ප්‍රකාශයේ වලංගුභාවය පිළිබඳව වූ **(a) කොටස** හා බැංකුකරුවෙකුගේ යුතුකම් පිළිබඳව වූ **(b) කොටසටද** අයදුම්කරුවන්ගෙන් බහුතරය නිවැරදි ලෙස උත්තර ලියා තිබුණි.

**(a) කොටස** සම්බන්ධයෙන් රේඛනය කළ චෙක්පත් පිළිබඳව අදාල කොන්දේසි හඳුනාගෙන අයදුම්කරුවන්ගෙන් බහුතරය අයකැමිගේ ප්‍රකාශය නිවැරදි බව සඳහන් කර තිබුණේය.

**(b) කොටස** සඳහා බැංකුකරුවෙකුගේ යුතුකම් අයදුම්කරුවන්ගෙන් බහුතරය නිවැරදිව දක්වා තිබුණේය.

**සමස්තයක් වශයෙන් මෙම ප්‍රශ්නය සඳහා උත්තර ලිවීමේ කාර්යසාධනය සතුටුදායක විය.**

<u>D කොටස</u>

## ප්‍රශ්න අංක **10**

මෙම ප්‍රශ්නය කොටස් දෙකකින් යුක්ත විය.

**(A) කොටස** ගිවිසුම් නීතිය මත පදනම් වී තිබුණි.

(a) අයදුම්කරුවන්ගෙන් බහුතරය මෙම කොටසට නිවැරදි උත්තර සපයා තිබුණි. ගිවිසුමක අත්‍යවශ්‍ය අංගයන් වන අර්පණය සහ ප්‍රතිග්‍රහණය නොමැති බැවින් **සමන්** හා **ගජන්** අතර ගිවිසුමක් නොවූ බව ඔවුන් සඳහන් කර තිබුණේය. තවද, ඔවුන්ගෙන් බහුතරය මෙය කරුණු දැක්වීමට ආරාධනයක් බවද සඳහන් කර තිබුණි.

(b) අයදුම්කරුවන්ගෙන් බහුතරය මෙම කොටසට නිවැරදි උත්තර ලියා ලකුණු ලබාගෙන ඇත. ගිවිසුමක අත්‍යවශ්‍ය මූලිකාංග සපුරා නොතිබූ හෙයින් නිමල් හා සිතුම් අතර වලංගු ගිවිසුමක් නොවූ බව ඔවුන් සඳහන් කර ඇත. සිතුම් ප්‍රති-අර්පණයක් කර ඇති බව ඇතැම් අයදුම්කරුවන් සඳහන් කර තිබුණේය.

**සමස්තයක් වශයෙන් මෙම ප්‍රශ්නය සඳහා උත්තර ලිවීමේ කාර්යසාධනය සතුටුදායක විය.**

**(B) කොටස** භාණ්ඩ විකිණීමේ ආඥා පනත මත පදනම් වී තිබුණේය.

(a) භාණ්ඩ විකිණීමේ ආඥා පනත යටතේ ව්‍යංග කොන්දේසි සහ මිලදී ගන්නා තැනැත්තාට තිබෙන ප්‍රතිකර්ම පිළිබඳව මෙම කොටසින් පරීක්ෂාවට ලක්කොට ඇත. දී ඇති සිද්ධිදාමයේ **නුවන්** සහ **සමීර** අතර, භාණ්ඩ විකිණීමේ ගිවිසුමක් ඇත. මෙම ගිවිසුමේ ව්‍යංග කොන්දේසි ඇතුලත්ය. ඒවා නම්, අරමුණ සඳහා සුදුසු වීම සහ විකිණීමට සුදුසු තත්ත්වයේ තිබීමයි. විස්තර අනුව භාණ්ඩ මිලදීගෙන ඇත්නම් ඒවා විස්තරය හා ගැලපිය යුතු වීමයි. එහෙත්, අයදුම්කරුවන්ගෙන් බහුතරය එක් ව්‍යංග කොන්දේසියක් පමණක් සඳහන් කර තිබුණි. එහෙත්, අයදුම්කරුවන්ගෙන් බහුතරය ගෙවන ලද මිල ආපසු අයකර ගැනීමට හෝ සුදුසු බයිසිකලයක් ඉල්ලා සිටීමට **නුවන්ට** හිමිකම තිබේයැයි සඳහන් කර තිබුණේය.

(b) භාණ්ඩ විකිණීමේ ආඥා පනතට අදාලව, පවත්නා භාණ්ඩ හා අනාගත භාණ්ඩ පිළිබඳව අයදුම්කරුවන්ගෙන් බහුතරය නිවැරදි ලෙස පැහැදිලි කර ලකුණු 4 න් ඉහළ ලකුණු ලබාගෙන ඇත.

**සමස්තයක් වශයෙන් මෙම ප්‍රශ්නය සඳහා උත්තර ලිවීමේ කාර්යසාධනය සාමාන්‍ය මට්ටමක විය.**

\- - -

**<u>විභාග අයදුම්කරුවන්ගේ කාර්යසාධන මට්ටම දියුණු කර ගැනීමට සැලකිල්ල යොමු කළ යුතු පොදු කරුණු</u>:**

(1) විෂය නිර්දේශය පූර්ණ වශයෙන් හොඳින් අධ්‍යයනය කර තිබීම හා විෂය කරුණු පිළිබඳ වැඩි අවධානය යොමු කිරීම.

(2) ප්‍රශ්නය කිහිපවරක් කියවා බලා නිශ්චිත ඍජු උත්තර සැපයීම කළ යුතු අවස්ථාවලදී අනවශ්‍ය පැහැදිලි කිරීම් / විස්තර ලිවීම් නොකළ යුතුය.

(3) "කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුව" විභාගයට පෙර මැනවින් අධ්‍යයනය කිරීම සහ ප්‍රශ්නය තුළ භාවිත කර ඇති **<u>කළ යුතු ක්‍රියාව</u>** තුළින් බලාපොරොත්තු වන උත්තර ක්‍රියා නිර්වචනයට අනුකූල වන ලෙස මැනවින් ඉදිරිපත් කිරීම.

(4) ස්ව-අධ්‍යයන පාඩම් මාලාව සහ මෙම විෂයට අදාල ග්‍රන්ථ, අත්පොත්, ලිපි, සඟරා, ආදිය මැනැවින් පරිශීලනය කිරීම.

(5) උත්තර ලිවීමේදී මූලික න්‍යායාත්මක සංකල්ප නිවැරදිව හඳුනාගැනීමට හා සංසන්දනාත්මකව විමසීමට අවශ්‍ය කුසලතා ගොඩ නැගීම.

(6) අත් අකුරු කියවිය හැකි ආකාරයටත් ප්‍රශ්න අංක නිවැරදිව නිසි පරිදි යෙදීමටත් කටයුතු කළ යුතුය.

(7) ප්‍රශ්න පත්‍රයේ දී ඇති උපදෙස් නිවැරදිව පිළිපැදීම.

(8) පසුගිය විභාග ප්‍රශ්න පත්‍ර හා උත්තර පරිශීලනය කිරීමෙන් තම දැනුම ප්‍රගුණ කළ හැකිය.

(9) ව්‍යාපාර නීතිය හා ආචාරධර්ම පිළිබඳ නිවැරදි අවබෝධයක් ලබා ගැනීම තුළින් එකිනෙක නීතිමය සංකල්ප ප්‍රායෝගික භාවිතයන්ට යොදවමින් ඒවා අතර ඇති වෙනස සන්සන්දනාත්මකව ගොනු කිරීමේ හැකියාව තිබිය යුතුය.

(10) කාලය මනාව කළමනාකරණය කර ගැනීම.

(11) උත්තර පත්‍ර බාරදීමට පෙර ප්‍රශ්න අංක / විභාග අංකය ආදිය නිසිපරිදි යොදා තිබේදැයි නැවත පරීක්ෂා කර බැලීම.

(12) පෙර සූදානමක් සහිතව විභාගය සමත්වීමේ පරම චේතනාවෙන් ඉදිරිපත් වීම.

- * * * -